

# ලොවක් හැඬවූ වියට්නාම ගැහැනිය යුදවාදීන්ට කියා දෙන පාඩම







වියට්නාම යුද්ධය අති විශාල මිනිස් ජීවිත ගණනක් ලෝකයට අහිමි කළ අතර එම යුද්ධයේ අම්හිරි මතක ඇතුලත් ඡායාරූප විශාල ප්‍රමාණයක් ලෝකය තුල සංසරණය විය.

එම ඡායාරූප අතරින් හද කම්පා කරවන වගේම ඉතා ජනප්‍රිය වූවක් ලෙස නිරුවත් ගැහැණු දරුවෙක් සහ තවත් ළමුන් පිරිසක් ගුවනින් හෙළන නාපාම් බෝ ම්බ වලට බියෙන් දිව යන අයුරු දැක්වෙන ඡායාරූපය හැඳින්වෙයි. වියට්නාම් යුද්ධයේ කුරිරු බව ලෝකයට කියාපාන්නට මේ එකම එක ඡායාරූපය සමත් විය. මෙම ඡායාරූපය වියට්නාම යුද්ධය ඉක්මනින් අවසන් වීමටත් හේතු වූ බව පැවසෙයි.

ඡායාරූපය ගෙන තිබුණේ 1972 වසරේදී Trang Bang නම් ගම්මානයේදීයි. මෙහි නිරුවතින් දිව එන ගැහැණු දරුවා අද වයස අවුරුදු 52 ක කාන්තාවක්. ඇගේ නම Kim Phuc ඇගේ පවුලේ පිරිස අවතැන් වී පන්සලක ලැගුම් ගෙන සිට ඇත. ඒ අවස්ථාවේ නවාතැන් ගෙනසිටි ප්‍රදේශයට බෝම්බ හෙළීමත් සමග ඇගේ සිරුරටත් ගිණි ඇවිලීම හේතුවෙන් ඇය ඇඳුම් සියල්ල ගලවා දමා බෝම්බ වලින් බේරීමට දුව ගොස් තිබෙනවා. (ඉතා කුරිරු බෝම්බ වර්ගයක් වූ නාපාම් බෝම්ම ඉලක්ක කරගත්තේ මිනිස් ජීවිතයි. බෝම්ම පිපිරීමෙන් හටගන්නා අති විශාල ගිනි ජාලාව මිනි සුන් පුලුස්සා මරා දැමූ බව කියැවෙයි)

පසුව ඇය ඇතුළු අනිත් දරුවන් ආරක්ෂිතව රෝහල වෙත රැගෙන ගොස් ඇත්තේ මෙම ඡායාරූපය ගත් ඡායාරූප ශිල්පියා වන Nick Ut විසිනුයි. Kim Phuc පවසන පරිදි පසුකලෙක ඇය මෙම ඡායාරූපයට මහත් සේ වෛර කර තිබෙනවා. නමුත් දැන් තත්ත්වය වෙනස්. ඇයට කරදරයක් වූ මෙම ඡායාරූපය දැන් ඇය ලෝක සාමය වෙනුවෙන් යොදාගනියි.

එක්සත් ජාතීන්ගේ නියෝජිතයෙක් ලෙස ක්‍රියාකරන Kim Phuc මෙම ඡායාරූපයත් රැගෙන යුද්ධයේ බිහිසුණු බව පිළිබඳ විස්තර කරමින් ලෝකය පුරා සංචාරය කරයි. ඒවගේම ඇය යුද්ධයෙන් අසරණ බවට පත්වෙන දරුවන්ට පිහිට වීම සඳහා සුබසාධන වැඩපිළිවෙලක්ද පවත්වාගෙන යයි.



කිම් ඡායාරූප ශිල්පි නික් සමග

ඇමෙරිකාව වියට්නාමයේ වියට්කොම් ගරිල්ලන්ට එරෙහිව දැවැන්ත හමුදා මෙහෙයුම් හා ගුවන් ප්‍රහාර ආරම්භ කළේ ඇමෙරිකානු රූකඩ පාලනය වියට්නාමය තුළ රැක ගැනීම වෙනුවෙනි. එහෙත් වියට්කොම් ගරිල්ලන්ගේ උපක්‍රමික ප්‍රහාර හමුවේ ලෝක යුද බලවතාට දරුණු ප්‍රතිප්‍රහාරයන්ට මුහුණ දීමට සිදුවිය. අවසානයේ ඇමෙරිකානුවෝ සිය පරාජය පිළිගනිමින් වියට්නාමයෙන් පිටවූහ.



# අසෙනිය කුසුම

නිරාෂ ගුණසේකර



**'අසෙනිය කුසුම' තීරුව දිග හැරෙන්නේ අපේ හිත ගත් කවියක විඳුම් විඳවුම් කෙබඳුද යන්න සහෘද ඔබත් සමඟ බෙදා හදා ගන්නටය. මෙය තවත් එක කාව්‍ය විචාරයක් නොවන අතර තොරාගනු ලබන කවියක් හොඳද නරකදැයි නිගමන නොදී, මිණුම් දඬු හා විචාරක්ෂීන් ගලවා තබා කවිය තුළම ගිලී කිමිදී රස උල්පත් පාදා ගන්නයි මේ කුඩා වෑයම.**

## සිනිඳු කවිය



**ගොරෝසු මෙබිම රළු දුක් අතර**
**ඔබ ගැනම පමණයි**
**සිනිඳු කවියක් ලිවිය හැක්කේ**

**මුඩු බිම නියං සායේ**
**ගිනි ඉර පරද්දා**
**ළා වැසි ඉස්මක් සිප**
**පැලි වැව මඩ දියත්තක නැගි**
**සිඟිති ඕලු කැකුළයි**
**ඔබ දුන් ආදරේ**

**වැඩ බිම දෝෂ බසැ'නී**
**මග තොට ගැටී පෑගී**
**කැලෑ මධුයෙන් - ධූම කුඩයෙන්**
**තෙමී වේලී තැලී ගන වූ**
**ම'සිත පොඟවා මොළොක් කළ ඒ**
**එකම මහිමය ඔබ සිනාවයි**

**ඒ නමුත් සොඳුරියේ දැනි'තින්**
**සිනිඳු බව ගැන පසිඳු නිදසුන්**
**ඕලු පෙත්තක සිනා මොළොකෙක**
**සෙවිය නොහැකිය තවත් මට නම්**

**ඔබේ මුදු දෑතැ'ඟිලි අතරේ**
**ළ'රත් දෙතොලේ සුමුදු පතුලේ**
**කෙහෙරැලේ ඇසිපියේ පමණයි**
**සිනිඳු බව අද මා දකින්නේ**

### ලක්ශාන්ත අතුකෝරල

('යටිවියන' කාව්‍ය සංග්‍රහය - 2007 )

ලක්ශාන්ත අතුකෝරලගේ 'යටිවියන' කාව්‍ය සංග්‍රහයේ 'සිනිඳු කවිය'යි අද තෝරාගත්තේ. සිනිඳු යන වචනය උසුලන්නේ ඉතාමත් සාපේක්ෂ අදහසකි. රළු බව නොමැති තැන අප අත්විඳින සිනිඳු බවක් නොවන්නේය. අත්විඳින දේ කොතරම් සිනිඳුදැයි අපට වටහා දෙන්නේද අප අත්දැක ඇති රළු බවේම ඝනකම විණා අනෙකක් නොවේ.

මෙහි කථකයා පටන්ගන්නේම අප ජීවත් වන පරිසරයේ අත්දකින්නට ලැබෙන දෛනික කර්ණකටුක ගොරෝසු බව කියාපාමිනි. ඒ රළු බව විවිධ-විෂම පරාස ඔස්සේ විහිදෙයි. ආර්ථික වශයෙන් අප විඳින දුෂ්කරතා, සෙනෙහසක් නොලැබෙන කල සිතට දැනෙන හිස්කම ඇතුළු තවත් බොහෝ දෑ ජීවිතයේ රළු පෘෂ්ඨය වඩාත් ගොරෝසු කරවයි. නමුත් එවන් දුෂ්කර කාල පරාසයක වුවත්, 'සිනිඳු කවියක්' ලියන්නට ඔහුට අවස්ථාවක් ලැබීයන්නේ ජීවිතයේ රළු බව මටසිලිටි කරන මහාර්ඝ ආදරයක් ලැබීයාමෙනි.

මෙතුවක් කල් ගතකළ ඔහුගේ ගොරෝසු දිවි පෙවෙත වඩාත් සුකොමළ වන්නේ හරියට නියං සායේ බැට කෑ සිඳුණු වැව් පතුලක් මත වට වැහි පොදකින් මතුවන ඕලු කැකුළක් පරිද්දෙනි. ආදරයක් හටගන්න ප්‍රාරම්භයේ එය කොතරම් ප්‍රහර්ෂාත්මකව හදට දැනෙන්නේදැයි කියන්නට මීට වඩා උදාහරණ අවශ්‍යයද?

ඔහු ලැබූ ආදරයේ මහිමය ඉහතාකාරයෙන් සාරාංශ කළද, තෙවැනි කොටසේදී කථකයාගේ ආධ්‍යාත්මය හා ජීවන වෘතාන්තය අපට වඩාත් සවිස්තරාත්මකව කියැවෙන්නට ඉඩහරී. ඔහුට එදිනෙදා ජීවිතයේ බොහෝමයක් ප්‍රශ්න ඇත. තම රැකියාව කරන ස්ථානයේ ශ්‍රමය සූරාකන ඉහළ පැළැන්තියේ සිට මිතුරු වෙසින් පෙනීසිටින භූමි මට්ටමේ සඟයන්ගෙන් පවා අතොරක් නැතිව නැගෙන දොස් පරොස් හේතුවෙන් රැකියාවත් එපාවේ. ඉන්පසු තවදුරටත් හිත එකලාසයක් කරගෙන එහි රැඳිය නොහැක. ඉබාගාතේ ඇවිදිමින් රැකියා සොය යන්නටත්, ඒ සංක්‍රාන්ති සමය තුළ සුරාව, මත් ද්‍රව්‍ය ආදියෙන් පියවි සිහියෙන් පළාගොස් විමුක්තිය සොයන්නටත් ඔහු පෙළඹේ. නමුදු අකාලයේ විනාශවන්නට නියමිත හදවතකට, මුදු මොළොක් ආදරයක් පවරා යළිත් ජීවිතයක් ලබා දී ඇත්තේ ඔහු දිනූ ආදරියගේ සිනාවයි.

ඉන'තුරුව බොහෝ රාත්‍රීන් ගෙවී හිරු දහසක් උදාවන්නට ඇත. නමුදු ඔවුනොවුන්ගේ ජීවිත වෙනත්ම මානයක සැරිසරන්නට පටන් ගෙන ඇති බව ඔහුගේ ආත්මාලාපයෙන් අපට ඇසේ. එනම්, ඒ'දවස දුක්ඛ කටුක කළල් මත නැඟි ළ'රත් නෙළුම් පෙත්තක් වන්වූ බිළිඳු පෙම්වතියගේ සිනාව අද දවසේ කොහේ හෝ සැඟව ඇති බවයි; අතුරුදන් වී ඇති බවයි. ඇය අද ඔහු හා එකම කුටුම්භයේ වසන බිරිඳක් වූවද, එදා ඈ සතුවූ බාල බොළඳ හුරතල් සිනා සැඟවීයන්නට, කාලයත් එක්ක ඔවුනොවුන්ගේ ජීවිත මත පැටවුණු වගකීම් වලින් මිරිකී ගිය පරිණතිය ඉවහල් වූවා විය හැක. එසේත් නැත්නම්, කායිකව එකට ජීවත් වුණද, සිතින් එකිනෙකා දෙතැනක ජීවත්කරවන්නට වෙනත් කරුණු-කාරාණා කාලය විසින් සම්පාධනය කළාදැයි නොදනිමු. ඒ කෙසේ වෙතත්, ප්‍රේමයක් පිළිසිඳ ගන්න මුල් අවස්ථාවට වඩා, යතාර්ථයේ සැබෑ ජීවිත මත පය තැබූ පසු එකිනෙකාගේ චිත්තභ්‍යන්තරයේ සිදුවන හැල හැප්පීම් හා වෙනස් කම් ඉතාමත් ස්වාභාවික, ඒ වෙනුවෙන් එකිනෙකාටම සර්ව සාධාරණ හේතූන් ඇති සංකීර්ණ අවස්ථාවන් විය හැකිය.

තව දුරටත් තමාට ජීවිතය දුන්, යහ මඟ පෙන්වූ, ඒ සිනාව ඈ දෙඅදර මත නොඇඳේ. නමුදු ඔවුන් භෞතික වශයෙන් එකට ජීවත් වේ. ඒ'දවස දෝතටම වඩාලා දුන් සිනහවේ මුදු මෙළෙක වෙනුවට අද දින ඔහු විඳින්නේ ඇයගේ ශරීරයේ මටසිලිටි බව පමණි. එය තව දුරටත් ආත්මීය බැඳීමක් නොවේ. ඇගේ අතැඟිලි, දෙතොල හා කෙහෙරැල් ඇසිපිය ඇසුරේ ලබන සුමුදු බවින් ඔහුට පලක් නැත. කථකයාගේ ස්වරයෙන් අපට හැඟීයන්නේ, සුසිනිඳු ඈ මුළු සිරුරම ඔහු වෙත නෛතිකව පැවරී තිබුණත්, අතීතයේ ඔහු හද කිතිකැවූ සිනාවේ සුසිනිඳුව හද පෙලන බවයි.

කලෙක වඩාත් සෞන්දර්යාත්මකව මතුවුණ ආධ්‍යාත්මික ආදරයක්, ශරීර කූඩු වලට පමණක් සීමා වුණු භෞතික වපසරියක් තනාදී අද දවසේ පෑල දොරින් පළාගොස් ඇත. එය ඉතාමත් උත්ප්‍රාසයක් දැනවුවද, ජීවිතයේ කෙනෙකුට අත්විඳින්න වන ඒ තිත්ත කටුක රළු පරළු බවට, ඔවුන්ටම අනන්‍ය වූ සාධාරණ හේතු ප්‍රත්‍යක්ෂයන් තිබෙන්නට පුළුවන.